# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

REACHING NATIONS

**India's National Spiritual Newspaper**

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

**Editor : S. SAM SELVA RAJ**

16 Languages

Vol. XVII FEBRUARY 2023 Issue No. 03


## ශුද්ධවූ බයිබලය

**(හිතෝපදේශ 3:26-35)**

26. මක්නිසාද ස්වාමින්වහන්සේ නුඹේ විශ්වාස භූමියව, නුඹේ පය අසු නොවන ලෙස ආරක්‍ෂා කරනසේක.

27. කරුණාව පෙන්වන්ට නුඹේ අතෙහි බලය තිබියදී, ඕනෑකරන අයගෙන් විය වලක්වා නොගනින්න.

28. නුඹ ළඟ තිබෙද්දීත්, ගොස් නැවත වරෙන්න. හෙට දෙන්නෙමියි නුඹේ අසල්වාසියාට නොකියන්න.

29. නුඹේ අසල්වාසියා නුඹ සමීපයෙහි නිසැකවම වාසය කරද්දී ඔහුට විරුද්ධව නපුරක් නොයොදන්න.

30. මනුෂ්‍යයෙක් නුඹට අනද්‍රයක් නොකර සිටිද්දී නිකරුණේ ඔහු සමග පොරට නොයන්න.

31. බලාත්කාර කරන අයට ඊර්ෂ්‍යා නොකරන්න. ඔහුගේ මාර්ග වලින් එකක්වත් තෝරා නොගනින්න.

32. මක්නිසාද වංක තැනැත්තා ස්වාමින් වහන්සේට පිළිකුලක්ය. නුමුත් උන්වහන්සේගේ මිත්‍රකම අවංක අය සමග ඇත්තේය.

33. ස්වාමින්වහන්සේගේ ශාපය දුෂ්ඨයාගේ ගෙය පිට තිබේ. නමුත් ධර්මිෂ්ඨයන්ගේ නිවාසයට උන්වහන්සේ ආශිර්වාද කරන සේක.

34. නින්දා කරන්නන්ට සැබැවින්ම උන්වහන්සේ නින්දා කරන සේක. යටහතුන්ට නම් කරුණාව දෙන සේක.

35. ඥානවන්තියන්ට ගෞරවය උරුම වේ. නමුත් අඥානයන්ට ලැබෙන්නේ ලැජ්ජාවය.

# මහත් අභිරහසක් THE GREAT MYSTERY

*(Message given by Pastor S. Sam Selva Raj at the Main Church)*

*'මේ රහස මහත්ය. නුමුත් මම ක්‍රිස්තුස්වහන්සේ ගැනත් සභාව ගැනත් කථා කරමි.'' (එපීස 5:32)*

ස්වර්ගරාජ්‍යයේ ආධිපත්‍ය මේ පොළොව තුල ක්‍රියාත්මක කිරීමට දෙවියන්වහන්සේගේ සභාව ස්වාමින්වහන්සේ පාවිච්චි කරයි. සභාව යනු ශුද්ධවන්තයින්ගේ සහභාගිත්වයයි. ක්‍රියා පොතේ පළමුවන පරිච්ඡේදයේ දහවන පදයෙහි සඳහන් කර ඇති පරිදි යේසුස්වහන්සේ සමග ජීවත් වූනාවූ උන්වහන්සේගේ ප්‍රේමයේ රසය වින්දාවූ අයට ගෝලයෝ නැමැති නම දී තිබුණි. මුල් කාලයේදී කිතුණුවන්ව හඳුන්වනු ලැබුයේ ''කිතුණුවන්'' යන නමිනි. **(ක්‍රියා 11:36)** අන් අය කිසිවෙක් ඔවුන් සමග එකතු වූයේ නැත. **(ක්‍රියා 5:13)**

විශ්වාසවන්ත කිතුණුවන් බොරු නොකියති. අන් අයට වංචා නොකරති. ඔවුන් දෙවියන්වහන්සේට භයව ඇවිදින්නාවූ අයයි. යමෙක් ඔබව පාවා දෙන්නේ නම් ඔහු දෙවියන්වහන්සේගේ දරුවෙක් නොවෙති. දෙවියන්වහන්සේගේ දරුවන් සමග විවෘත ලෙස කථා කිරීමට හැකිය. ක්‍රිස්තුස්වහන්සේගේ ආකෘතිය අනුගමනය කරන අය දෙවියන්වහන්සේගේ දරුවෝය. මෙවැනි අය ක්‍රිස්තුස්වහන්සේව අනුගමනය කරන නිසා කිසි විටෙක යේසුස් ක්‍රිස්තුස්වහන්සේව ප්‍රතික්ෂේප නොකරති.

අද ලෝකයේ තිබෙන්නාවූ විශාලතම අභිරහස නම්

*3 වෙනි පිටුවට ...*




**Echo of His Call**

*YouTube Christian Channel !*

5 minutes messages!!

**English, Hindi, Tamil & Telugu**

Every day – 5.00 A.M.


**Tamil Sunday Service – 8.30 A.M.**

You will get an opportunity to pray with **Pr. S. Sam Selva Raj!**

ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)

## from your dearly beloved brother...

REACHING NATIONS



# කැඳවීමේ ප්‍රතිරාවය



**OUR MISSION POLICY**

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

CHIEF EDITOR
Angeline Selvakumari Henry, M.A., M.Ed.
MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.
ADMINISTRATION
Bro. N. Prakasam, M.A., General Manager
EDITORIAL BOARD
Sis. Jesy Veena Sam
Sis. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Dr. A. Richard Samuel, M.A., Ph.D.
Rev. Dr. K.R. Rajasekaran
EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293,
2854 7766
Cell : (+91) 98410 71852, 95661 31858
CORE LEADERS
Bro. K. Puratchivendan
Bro. A. Edward Durai
Bro. A. Alvin
Bro. K. Abraham
Sis. Dhanalakshmi Chinnaiah
E.mail ID
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.com
YOUTUBE CHANNEL
Echo of His Call

**"... I have set before you an open door, and no one can shut it..." - Revelation 3:8**

**ප්‍රේමණීය මිත්‍රයෙනි,**
**අපගේ ස්වාමිවූ විශ්වයේ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ බලවත් නාමයෙන් ඔබට සුභ පැතුම් ගෙනෙමි.**

කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව තුළින් එහි ප්‍රකාශව ඇති පණිවිඩය තුළින්ද අපගේ Youtube නාලිකා තුලින්ද, අප ශුභාරංචිය ප්‍රකාශ කිරීම ගැනත් එය කරණකොටගෙන ලැබෙන්නා වූ ආශිර්වාද ගැනත් අපි දෙවියන්වහන්සේට ප්‍රශංසා කරමු. මා සමඟ සේවය කරන්නා වූ ප්‍රිය දේව දරුවන් වන ප්‍රිය ඇලෙක්ස් සැම්සන් සැම්, පාස්ටර් චෙන්නයියා, සහෝදරී දනම් චෙන්නයියා, මේරි මැග්ඩලින් සහ සහෝදර එන්. ප්‍රකාශම්, ක්‍රිස්ටිනා, ජෙබ කුමාරි, චෙන්නයියා, බී. සරත්, පාස්ටර් වේදමුදලියර් ආබ්‍රහම්, ශලෝම් ආබ්‍රහම්, ගීතා ගුරුස්වාමි, ඩේසි රාණි, සොලමොන් රොබට්, යෝෂුවා රොබට්, එඩ්මන් තෝමස් යන මේ සියලුදෙනා නිසා මා දෙවියන්වහන්සේට ප්‍රකාශ කරමි.

සමහර අයගේ ඉතා දරුණු පාපය ගැනත් සභාව තුළ සිදුවන වැරදි ගැනත් අප යම් යම් අවවාද දෙමින් ඔවුන්ව අගය කිරීමට උත්සාහ දරමි. එයට ඔබගේ යාච්ඤාව සහ උපකාරය ඉතා වැදගත්ය. සේවයේ මාර්ගය ඉතාම අමාරුයි. යක්ෂයා අපට විරුද්ධව ඉතා තදබල ලෙස ක්‍රියා කරයි. යක්ෂයාට විරුද්ධව ක්‍රියා කිරීමට දෙවියන්වහන්සේගේ බලය අප සමඟ තිබෙන බව ඔහු දනී. මෙම සෑම පීඩාවක් තුළින්ම අපව ආරක්ෂාකර තබා ගන්නේ ස්වාමීන්වහන්සේ පමණක්මය.

ඔබගේ ප්‍රශ්න සහ අමාරුකම් පිළිබඳව අප තේරුම් ගෙන ඒ උදෙසා නොකඩවාම යාච්ඤා කරමු.

දෙවියන්වහන්සේගේ කැමැත්ත පරිදි 2023 වසරේ ජුනි මස අපගේ නෙහෙමියා බයිබල් විදුහලෙහි උපාධි පිරිනැමීමට අප සූදානම් වෙමු. 2023 සහ 2021 යන වර්ෂයන් උදෙසා දෙවියන්වහන්සේගේ සේවයේ පුහුණුව ලැබීමට ශිෂ්‍ය ශිෂ්‍යාවන් අපට අවශ්‍යව ඇත. මේ උදෙසා යාච්ඤා කරන්න. සේවය උදෙසා කැපවීම් කිරීමට අප සිටීනම් අපට දැනුම් දී ඒ අයව අප වෙතට එවන්න. අප කිසිම ආදායමක් නොමැතිව දේව වචනය ගොඩනැගීමටත්, ශුභාරංචිය ප්‍රකාශ කිරීමටත් ඉතා වෙහෙස මහන්සි වෙමු. කරුණාකර හින්දි හා දෙමළ බසින් පවත්වන්නාවූ බයිබල් විදුහල ගැනද යාච්ඤා කරන්න. එසේම අපගේ සියලුම සේවාවන් උදෙසාද යාච්ඤා කරන්න.

අප ඔබ උදෙසා යාච්ඤා කරමු. දෙවියන්වහන්සේගේ කරුණාව ඔබ සමඟ වේවා. ආමෙන්

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සේවක**

**පාස්ටර් සැම් සෙල්වරාජ් සහ ඇලෙස්ත් සැම්සන් සැම්**

(+91) 98412 71858 / 98410 71858, E.mail : samselvaraj333@gmail.com

**Our Ministries:** ECHO OF HIS CALL Monthly Magazines (16 languages) ❂ BIBLECOR - Postal Courses (3 languages) ❂ Online Courses ❂ Theological Correspondence Courses (2 languages) ❂ Church Planting ❂ Nehemiah Bible Colleges ❂ Gospel Printing Press ❂ Great Commission Partners ❂ St. Paul's Matriculation School ❂ Crusades ❂ Community Development

*1 පිටුවෙන්....*

දෙවියන්වහන්සේගේ සභාවත් දෙවියන්වහන්සේගේ දරුවනුත් අතරේ තිබෙන්නාවූ සම්බන්ධතාවයයි. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මෙම අභිරහස ස්වර්ගයේ සිට සභාව තුළින් ඇදහිලිවන්තයින් සමග ක්‍රියාත්මක කරනු ලබයි. දෙවියන්වහන්සේ තුළින් උපත ලැබුවාවූ අය ස්වාමින්වහන්සේගේ දරුවෝය. එනම් ඔවුන් දිළිඳුව සිටින අය වීමට පුළුවනි. ධනවත්ව සිටින අය වීමට පුළුවනි. එසේත් නොමැති නම් කඳුළු සමග ජීවිතය ගතකරන්නාවූ අය, බලාපොරොත්තු අහිමි වූ අය හෝ අන් අයගේ ප්‍රතික්ෂේපවීම් වලට මැදිවූ අය යන මේ සෑම දෙනාම යේසුස් ක්‍රිස්තුස්වහන්සේව විශ්වාස කරනවානම් ඔවුන් යේසුස්වහන්සේ තුළින් උපත ලැබූ අයයි. ***(යොහාන් 1:13)***

ක්‍රිස්තුස්වහන්සේ සහ සභාව අතර තිබෙන සම්බන්ධතාවය මනුෂ්‍යයාට ජීවත් වීමට අවශ්‍ය සියළුම සත්‍යතාවයන් අභිරහසක් ලෙස සැඟවී පවතී. නමුත් අද මනුෂ්‍යයන් ප්‍රීතිය සමාදානය හා ජීවිතයේ දියුණුව සොයන පිණිස ජීවිතයේ වෙනත් මාර්ග සොයාගෙන ඇත. ඔවුන්ට මෙම අභිරහස නොතේරෙනු ඇත. දේව වචනය තුල බොහෝ අභිරහස් ගැන පවසා තිබුණත් මහත් අභිරහස නම්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ උන්වහන්සේගේ සභාව අතර තිබෙන්නාවූ සම්බන්ධතාවයි. මේ අභිරහස අප දැනගනු ලබන්නේ එය අපගේ ජීවිතය වෙනස් කිරීම තුළිනි.

ක්‍රිස්තුස්වහන්සේ ගැන තිබෙන්නාවූ සත්‍යතාවය, එනම්, උන්වහන්සේ ලෝකයේ ගැලවුම්කාරයාය යන මේ කාරණය කිසිම සංස්කෘතියකටවත් අවස්ථාවකටවත් මූලධර්මයකටවත් වෙනස්කල නොහැකිය. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන පැහැදිලි අවබෝධයක් නොමැති අය ක්‍රිස්තුස්වහන්සේව පිළිගැනීමට කැමැත්තක් දක්වන්නේ නැති අතර එය ඔවුන්ට වැරදි වැටහීමක් ඇති කරයි.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේව විශ්වාස කරමින් ගමන්කරන්නාවූ කෙනෙක්ව දෙවියන්වහන්සේ කවදාකවත් අත්හැර තිබෙනවාද? දිළිඳුන්ට බලාපොරොත්තුවක් තිබෙනවාද? නැතිනම් ඔවුන් සමග ජීවත්වෙන්නාවූ අයට ප්‍රශ්නයක් වන ලෙස ජීවත්වෙනවාද? කිසි කෙනෙකුට මේ කාරණා වලට 'ඔව්' කියා ප්‍රකාශ කිරීමට නොහැකිය. ***"මම යෞවනව සිටියෙමි, දැන් මහළුව සිටිමි, එසේවී නුමුත් ධර්මිෂ්ඨයා අත්හරිනු ලැබූ බවවත්, ඔහුගේ වංශය කෑම සිඟන බවවත් නුදුටුමි." (ගීතාවලිය 37:25)*** ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කරන්නාවූ අයෙක් කෑම නිසා හිඟාකන්නේ නැත.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උපත හා අලුත් අවුරුද්ද සමරනු ලබන්නේ කිතුණුවන් පමණක් නොව සෑම රටකම සිටින්නාවූ සියලුම ආගමිකයින් හා සියලුම ජාතීන්ද මෙය සමරති. ජනවාරි මස පළමුවන දින සෑම නමස්කාර ස්ථානයකම හා සෑම ආගමික ස්ථානයකම අලුත් අවුරුදු උදාව සමරනු ලබන්නේ ඇයි? මන්ද සත්‍යතාවය සැමදාම සත්‍යව පවතී. සත්‍ය වසන් කිරීමට කිසිවෙකුට නොහැකිය. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උපත කරණකොටගෙන ක්‍රිස්තු පූර්ව (ක්‍රි. පූ) සහ ක්‍රිස්තු වර්ෂ යන ලෙසින් ලෝක ඉතිහාසයම වෙනස් කරනු ලැබීය. ලෝකය දෙවියන්වහන්සේගෙන් ඈත්විය. නමුත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේගේ ප්‍රේමයත් කරුණාවත් උන්වහන්සේගේ උපත, මරණය, මළවුන්ගෙන් නැගිටීම කරණකොටගෙන නැවත උන්වහන්සේව ලබාගත්තේය. ***(රෝම 5:8)*** මිය ගියාවූ සෑම දෙනාගේම ශරීරයන් සොහොනෙහි තිබියදී යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය පමණක් මළවුන්ගෙන් නැගිට්ටේ ඇයි? යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේ සහ ගැළවුම්කාරයාණන්ය. උන්වහන්සේ මරණයෙන් ජය ලබා මළවුන්ගෙන් නැගිටුණාවූ තැනැන්වහන්සේය. යමෙක්ට යේසුස්වහන්සේගේ සභාවට පීඩා කිරීමට හා වෛර කිරීමට පුළුවනි. නමුත් දෙවියන්වහන්සේගේ සභාව මනුෂ්‍ය පාලනය යටතේ නැති අතර එය දෙවියන්වහන්සේගේ පාලනය යටතේ පමණක්ම තිබෙන්නාවූ දෙයකි.

ලෝකය ආරම්භයේ සිට දෙවියන්වහන්සේගේ දරුවන් සහභාගීත්වයට ප්‍රශ්න කරදර හා විරුද්ධතාවයන් පැමිණුනේය. නමුත් කිසිවෙකුට දෙවියන්වහන්සේගේ සභාව නතර කිරීමට බැරි විය. ඉතිහාසය දෙස බලන විටදී අප දන්නාවූ දෙයක් නම්, බොහෝ රටවල් නොයෙකුත් බලවේගයන් ක්‍රිස්තුස්වහන්සේගේ සභාව පාලනය කිරීමට උත්සාහ දැරුවත් ඔවුන් එයින් අසාර්ථක වූ බවයි. එම නිසා අප ශුභාරංචිය ඉතා ප්‍රඥාවන්ත ලෙස ප්‍රකාශ කල යුතුව ඇත. දෙවියන්වහන්සේගේ තේජස තුළ හා උන්වහන්සේගේ දැනගැන්ම තුළ මනුෂ්‍යයාට අවශ්‍ය සමාදානය ලබා දිය යුතුයි. තවද අද දක්වා කිතුණු සභාවට දෙවියන්වහන්සේ සෙනඟ රැස්කරනු සේක.

## (1) මගේ සභාව මම ගොඩනගමි

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සිසිලිය සහ පිලිප්පිය යන පළාත්වලට ගිය විට උන්වහන්සේගේ ගෝලයින්ගෙන්

උන්වහන්සේ මෙසේ ඇසුවේය. ''මනුෂ්‍යයා මා කවුරුන් කියා පවසනවාද? ඔවුන්ගේ පිළිතුර වූයේ, සමහරු ඔබ යොහාන් බෞතීස්ත කියාත්, සමහරු එළියාය කියාත්, තව සමහරු යෙරමියාය කියාත්, තවත් සමහරු ඔබ ප්‍රොපේතවරයෙක්ය කියාත් පවසති.''

නමුත් උන්වහන්සේ ඔවුන්සේගෙන් ඇසුවේ නුඹලා මා ගැන පවසන්නේ කුමක්ද? කියාය. එයට සීමොන් පේත්‍රුස් පිළිතුරු දෙමින් ***''ඔබ ජීවමානවූ දෙවියන්වහන්සේගේ පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ'' ය කියාය. යේසුස්වහන්සේ එයට පිළිතුරු දෙමින් ''සීමොන් බර්-යෝනා, නුඹ ආශිර්වාදලද්දෙක්ය. මක්නිසාද ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන්වහන්සේ මිස මාංසය හා රුධිරය මේක නුඹට එළිදරව් නොකලේය. මම නුඹට කියමි, නුඹ පේත්‍රුස්ය. තවද මේ පර්වතය පිට මාගේ සභාව ගොඩනගන්නෙමි. පාතාලයේ දොරටු ඒක පරාජය නොකරන්නේය.'' (මතෙව් 16:17-18)***

අපගේ ස්වාමීන්වහන්සේ සීමොන්ගෙන් අසනු ලැබූයේ අන් අය උන්වහන්සේ ගැන පවසන්නේ කුමක්ද? කියාය. මනුෂ්‍යයා උන්වහන්සේ ගැන පවසන්නේ කුමක්ද කියා දැනගැනීමට දෙවියන්වහන්සේ කැමැත්තෙන් සිටී. මෙයින් පැහැදිලි වන්නේ සෑම ආත්මික නායකයෙක්ම අනික් අය ඔවුන් මනුෂ්‍යයන් මා හට කුමක් පැවසුවත් මා ඒවා ගණන්ගන්නේ නැත. මා මගේ හෘද සාක්ෂියට අනුව වැඩ කරනවාය කියා සමහරු පවසති. නමුත් යේසුස්වහන්සේ පේත්‍රුස්ගෙන්, ''අන් අය මා ගැන කුමක් පවසනවාද?'' කියා ඇසූ විට ඔහුගේ පිළිතුර වූයේ, ''ඔබ ජීවමාන දෙවියන්වහන්සේගේ පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේය.'' කියාය. මෙය පේත්‍රුස්ට ලැබූ එළිදරව්වක්ය. එවිට යේසුස්වහන්සේ ඔහුට පැවසුවේ, මාංසය සහ රුධිරය ඔබට මෙය එළිදරව් කලේ නැත. ස්වර්ගයේ සිටින මාගේ පියාණන්වහන්සේම මෙය නුඹට එළිදරව් කරන ලද්දේය.'' යනුවෙනි.

අද මනුෂ්‍යයන්ට යේසුස්වහන්සේගේ සත්‍යතාවය තේරුම් ගැනීමට ප්‍රඥාවක් නොමැත. එම නිසා ක්‍රිස්තුස්වහන්සේත් උන්වහන්සේගේ සභාව සාමාන්‍ය දෙයක් ලෙස පිළිගනී. නමුත් යමෙක් තමාගේ මුළු හදවතින්ම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැළවුම්කරු ලෙස පිළිගන්නේ නම්, මාංසය සහ රුධිරය නොව ස්වර්ගයේ සිටින දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ආත්මය කරණකොටගෙන ක්‍රිස්තුස්වහන්සේගේ එළිදරව්ව ඔහුට ලැබෙනු ඇත. යේසුස් ක්‍රිස්තුස්වහන්සේව පිළිගත් සියලු දෙනාටම දෙවියන්වහන්සේගෙන් එළිදරව්වක් ලැබී තිබේ. අපගේ පරණ ජීවිතය ගැන දෙවියන්වහන්සේ සිතන්නේ නැතිව අප යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිගත් විට අලුත් මැවිල්ලක් ලෙස අපට දෙවියන්වහන්සේ මේ එළිදරව්ව දී තිබේ.

දෙවියන්වහන්සේ මට කතා කලේ නැහැ කියා ඔබට පැවසීමට නොහැකිය. එසේ නොමැතිනම් ස්වාමීන්වහන්සේගේ හඬ ඔබට ඇසුනේ නැහැ කියාද පැවසිය නොහැක. මන්ද යෙසුස්වහන්සේ ප්‍රේතුස්ට පවසනු ලැබූයේ, මාංශය හා රුධිරය නොව මෙය දෙවියන්වහන්සේම ඔබට එළිදරව් කලාය කියාය. එමනිසා ඔබ ක්‍රිස්තුස්වහන්සේව පිළිගත යුතුය. යේසුස්වහන්සේ සැබෑවූ දෙවියන්වහන්සේයි. එමනිසා ක්‍රිස්තුස්වහන්සේගෙන් එළිදරව්වක් ලැබූ කෙනෙක් මේ ලෝකයේ දේ අත්හැර දෙවියන්වහන්සේ සමග තිබෙන්නාවූ සම්බන්ධතාවය කරණකොටගෙන ස්වර්ගරාජයේ එළිදරව්වක් ලැබූ කෙනෙක් ලෙස පවිත්‍ර ජීවිතයක් ගත කල යුතුය. මෙම එළිදරව්ව ලැබූ දෙවියන්වහන්සේගේ දරුවෝ ඔවුන්ගේ සෑම දේ තුළින්ම පැහැදිලි ලෙසම පවසා ඇත.

## 2. මාගේ සභාව

ඕනෑම කෙනෙක්ට මේ ලෝකය තුළ ඕනෑම රැකියාවක නියුතු විය හැකිය. නමුත් සභාව ගොඩනැගීමේ ක්‍රියාව පවතින්නේ දෙවියන්වහන්සේ මතයි. ***(මතෙව්***

*6 වෙනි පිටුවට....*

**Pray for NEHEMIAH BIBLE**
**RESIDENTIAL / EVENING COLLEGE,**
Velachery / Chepauk & Santhoshapuram, Chennai.
Medium : Hindi / Tamil
Registered Candidate for Membership
Asia Theological Association (ATA)
Recognised by International Christian Leaders &
Senior Pastors for the past 53 years
**Certificate in Theology : One year**
**Diploma in Theology : Two years**
Qualification : 10th Standard & above
**Rush for admission!**
**Contact : The Chairman, Nehemiah Bible College.**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org
✶ ONLINE CLASSES ARE AVAILABLE ✶

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**පෙබ:19-** පාස්ටර් සෑම් සෙල්වරාජ් ඇතුළු පවුලේ සැම සාතනික බලපෑම් වලට හසුනොවී සිටීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**පෙබ:20-** තරුණ තරුණියන්, කැඳවීමේ ප්‍රතිරාවය මූලස්ථානයේ ක්‍රියාකාරකම් වලට උනන්දුවකින් සහභාගීවීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**පෙබ:21-** යාච්ඤා මැදිහත්කරුවන්, මහා ආඥාවේ මැදිහත්කරුවන් ඇතුළු අනෙක් සේවකයන් සහ ඔවුන්ගේ පවුල්වල අය ස්වාමීන්වහන්සේගේ කරුණාව ලැබීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**පෙබ:22-** කැඳවීමේ ප්‍රතිරාවය You Tube සමාජ ජාලයට සම්බන්ධවී සේවය කරන මාධ්‍ය කණ්ඩායම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**පෙබ:23-** කැඳවීමේ ප්‍රතිරාවය You Tube සමාජ ජාලයට අලුත් වීඩියෝ කැමරාවක් ලැබීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**පෙබ:24-** පාස්ටර් සෑම් සෙල්වරාජ් විසින් විවිධ ආකාරයෙන් කරනු ලබන දේව සේවයන් ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**පෙබ:25-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ යෙදී සිටින සියලුම සේවකයන්ගේ දිව්‍යමය ආරක්ෂාව සහ සුවය ගැන ස්තුති ප්‍රශංසා කරන්න .

**පෙබ:26-** සභාවේ ඇදහිලිවතුන්ගේ සදාචාරාත්මකභාවය සහ මූල්‍යමය උපකාර ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**පෙබ:27-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ YouTube සමාජ ජාලය විවිධ භාෂා කථා කරන සෙනඟ වෙතට යාම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**පෙබ:28-** 2023 වර්ෂය සඳහා නිර්මාණය කළ දින දර්ශනයේ වැඩ අවසන් කර නිකුත් කිරීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**2023 මාර්තු මාසය**

**මාර්:01-** ප්‍රධාන දේව සභාවේ සියලු ක්‍රියාවන් නිසි කළමනාකරණයට යටත්ව කිරීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**මාර්:02-** නෙහෙමියා බයිබල් විදුහලේ සිසුන්ට සංගීත පන්තියක් ලැබීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**මාර්:03-** නෙහෙමියා බයිබල් විදුහලේ පැවැත්වූ විශේෂ නත්තල් දේව මෙහෙයට ලැබුන ආශිර්වාද ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**මාර්:04-** නෙහෙමියා බයිබල් විදුහලට 2023-2024 අධ්‍යනය වර්ෂ සඳහා නේවාසික සිසුන් ලැබෙන පිනිස යාච්ඤා කරන්න.

**මාර්:05-** ශාන්ත පාවුළු මෙට්‍රිකුලේසන් විදුහලට 2023 - 2024 අධ්‍යනය වර්ෂ සඳහා සිසුන් ලැබෙන පිනිස යාච්ඤා කරන්න

**මාර්:06-** පාස්ටර් සෑම් සෙල්වරාජ් ඇතුළු පවුලේ අය නපුරු දුෂ්ට බලවේග වලින් ආරක්ෂා වීම ගැන යාච්ඤා කරන්න.

**මාර්:07-** නැවත ව්‍යාප්තවී ඇති කොවිඩ් වසංගතයෙන් ලෝක ජනතාවට දිව්‍ය ආරක්ෂාව ලැබීම ගැන යාච්ඤා කරන්න.

**මාර්:08-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ සියලුම තාක්ෂනික නිලධාරින් ගැන යාච්ඤා කරන්න.

**මාර්:09-** තරුණ තරුණියන්ගේ ගැලවීම උදෙසා යාච්ඤා කරන්න.

**මාර්:10-** කිතුණු දේශකයන් ව්‍යාජධර්ම වලින් තොරව දේශනා කරන පිනිස යාච්ඤා කරන්න.

**මාර්:11-** සිරගෙවල්වල සේවය කරන දේව සේවකයන් ගැන යාච්ඤා කරන්න.

**පෙබ:12-** අහිතකර පරිඝණක ක්‍රීඩා වලින් කිතුණු තරුණ තරුණියන් ගලවා ගැනීම පිනිස යාච්ඤා කරන්න.

**පෙබ:13-** කැඳවීමේ ප්‍රතිරාවය YouTube සමාජ ජාලය තුළින් විකාශනය වන පාස්ටර් සෑම් සෙල්වරාජ්ගේ ඉගැන්වීම් ගැන යාච්ඤා කරන්න.

**පෙබ:14-** සභාවේ ඉගැන්වීම සහ පරිවර්තන සේවය කරන අය ගැන යාච්ඤා කරන්න.

**මාර්:15-** කැඳවීමේ ප්‍රතිරාවය සහකාර කතෘ වරුන් හා ඔවුන්ගේ පවුලේ අය ගැන යාච්ඤා කරන්න.

**මාර්:16-** කැඳවීමේ ප්‍රතිරාවය නිර්මාතෘ පාලක සෑම් සෙල්වරාජ්ගේ ජීවිතකථාව පලකිරීම ගැන යාච්ඤා කරන්න

**මාර්:17-** ඊශ්‍රායලයේ සමාදානය උදෙසා යාච්ඤා කරන්න.

**මාර්:18-** වැඩිහිටි නිවාස වල සිටින වැඩිමහල්ලන් ගැන යාච්ඤා කරන්න.

*4 පිටුවෙන්....*

*16:18)* වන පදයෙහි යේසුස්වහන්සේ පවසනු ලැබුයේ ***"මාගේ සභාව නොව මා ගොඩනගමි."*** යනුවෙනි. ප්‍රේතුස් සහ පාවුළු උන්වහන්සේගේ සභාව ගොඩ නගයි කියා උන්වහන්සේ පැවසුවේ නැත. නමුත් පාතාලයේ දොරටු එය ජය ගත්තේය කියා පැවසුවේය.

දෙවියන්වහන්සේගේ සෙනඟ රැස්වෙන්නාවූ ස්ථානයට 'දෙවියන්වහන්සේගේ සභාව' කියා හඳුන්වයි. එය ගොඩනැගිල්ලක් නොවේය. සභාවක නමස්කාර දේව මෙහෙයක් පවත්වනවාය කියා හඳුන්වන්නේ එය ගොඩනැගිල්ලක් නොව දෙවියන්වහන්සේගේ සෙනග රැස්වී නමස්කාර කිරීමයි.

දෙවියන්වහන්සේ ගොඩනගන සභාව නම් උන්වහන්සේගේ සෙනග තුලින් උන්වහන්සේ මහිමයට පත්වෙන්නාවූ ශුද්ධවන්තයින්ගේ එකමුතුවකි. එනම් ස්වාමින්වහන්සේ ඔබව ගොඩනගයි. පාතාලයේ දොරටු එය ජය ගන්නේ නැහැ කියා දේව වචනය පවසයි. මෙය අප පිළිගන්නේ නම්, ඔබගේ ජීවිතයෙන් සභාවට වැදගත් ස්ථානයක් දිය යුතුය. උන්වහන්සේ අපට පවසන කාරණය නම්, උන්වහන්සේ අපට ගොඩනගා දියුණුවට පත් කරන බවත් පතාලයේ බලය අපගෙන් එය ගන්නේ නැති බවත්ය. දෙවියන්වහන්සේ ඔබගේ අමාරුකම් හා වේදනා දෙස බලා ඒ තුලින් ඔබව ගොඩ නඟයි. ලෙඩ රෝග ප්‍රශ්න, ණය බර, දිළිඳුකම් හා යක්ෂයාගේ බලයන් ඔබට විරුද්ධව පැමිණෙන්නේ නැත. මන්ද ඔබ දෙවියන්වහන්සේගේ සභාවට අයිති කිසිවෙක්ව උන්වහන්සේ අමතක කරන්නේ නැත.

මෙවැනි සෙනඟව පර්වතයක් මත නිවසක් තැනූ මනුෂ්‍යයෙකුට සමාන කරයි. එසේම වැලි මත තම නිවස තැනූ මනුෂ්‍යයාගේ ගෙය මතට වර්ෂාව පැමිණ ගැලූ විට එම නිවස විනාශ වී යනු ඇත. නමුත් පර්වතය මත නිවස තැනූ මනුෂ්‍යාගේ ගෙය මතට වර්ෂාව පැමිණ ජල ගැලීමක් පැමිණුනත් එම නිවස ස්ථිරව තිබේ. අමාරුකම්, පරාජයන් හා ප්‍රශ්න පැමිණීමට පුළුවනි. නමුත් එම මනුෂ්‍යයා ස්ථිරවම සිටගනී. ඔබ දෙවියන්වහන්ගේ සභාව නිසා දෙවියන්වහන්සේ ඔබව ගොඩනගයි. පාතාලයේ දොරටු ඔබට විරුද්ධව පැමිණෙන්නේ නැත. ඔබ ක්‍රිස්තුස් නැමැති පර්වතය මත ඔබගේ ආත්මික ජීවිතය ගොඩනගන්නේ නම් ඔබ කිසි විටෙක සෙලවෙන්නේ නැත.

අප ස්වාමින්වහන්සේගේ සභාවට අයිති සෙනඟක් වන විට අප ජයග්‍රාහී සෙනගකි. එනිසා දේව වචනය මෙසේ පවසයි. ***"සමහරුන්ගේ පුරුද්ද ලෙස අපේම රැස්වීම් අත්නැර... "*** *(හෙබ්‍රෙව් 11:25)* අද බොහෝ දෙනාට අමාරු කාරණයක්නම්, සභාවට පැමිණීමයි. ඔවුන් සභාවට පැමිණීමට බැරි හේතු ලෙස සභාව දුර වැඩියි, අපට මහන්සියි, ප්‍රවාහන පහසුකම් නැහැ යන කරුණු කාරණා පවසයි. මෙවැනි අය දෙවියන්වහන්සේගේ සෙනඟ සමග එකතු දෙවියන්වහන්සේට ප්‍රශංසා කිරීමත්, දේව ආශිර්වාදය ලැබීමත් දෙවියන්වහන්සේගේ කරුණාව අයැදීමත් යන මේ දේවල් ප්‍රතික්ෂේප කරති. දෙවියන්වහන්සේගේ සභාවටත් ක්‍රිස්තුස්වහන්සේ සමග තිබෙන සම්බන්ධතාවයටක් ඇති අභිරහසක් කිසිවෙකුට තේරුම් ගැනීමට අපහසුය. ඔබ සභාව තුල සිටිනවානම් ඔබ ජයග්‍රාහියෙකු වනු ඇත.

ක්‍රිස්තුස්වහන්සේව පිළිගත් අය ක්‍රිස්තුස්වහන්සේගේ සභාවේ සාමාජිකත්වය ගත් අය සභාවේ කටයුතු වලට සම්බන්ධ වන අයව ලෝකයේ බලවේග වලට විනාශ කල නොහැකිය. සෑම දේව දරුවෙක්ම ජයග්‍රාහිකයෙකු වෙයි. අද දෙවියන්වහන්සේගේ ආධිපත්‍ය පිළිගත් රටවල් දෙවියන්වහන්සේ ආධිපත්‍ය භුක්ති විඳිති.

ඔබ මේ සත්‍යතාවය පවසන විට පළමුව මනුෂ්‍යයන්ට එය තේරුම් ගැනීමට අසීරුය. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිගත් අය මේ ලෝකයට අයිති නැත. ඔවුන්ව ආරක්ෂා කරනු ලබන්නේ ස්වර්ගරාජ්‍යයි. ඔවුන් කොතරම් ප්‍රශ්න, කරදර හා අමාරුකම් තුලින් ගමන් කරනු ලැබූවත් ඔවුන් ක්‍රිස්තුස්වහන්සේගේ සභාවට අයිති සෙනඟ නිසා ඔවුන් ජයග්‍රාහිකයෝ වෙති.

## 3. ස්වාමින්වහන්සේගේ ගෘහයෙහි හිඳුවන ලද්දෝ සඵලවන්නෝය.

***"ස්වාමීන්ගේ ගෘහයෙහි හිඳුවන ලද්දෝ අපේ දෙවියන්වහන්සේගේ මිදුල්වල සඵලවන්නෝය. (ගීතාවලිය 92:13)***

කෘතිම පැලෑටියක් රැගෙන එය එක් එක් ස්ථානයක සිට වෙනත් ස්ථානයක තැබීමට අපට පුළුවනි. ඒවාට වතුර අවශ්‍ය නැත. දෙවියන්වහන්සේගේ ගෘහයෙහි හිඳුවනු ලැබූ අයට සිටුවා ඇත්තේ තාවකාලිකව හෝ කෘතිම පැලයක් ලෙස නොවේය. ස්වාභාවික වූ පැලයක් පොළොව මත පැල කරයි. එයට වතුර අවශ්‍යය වෙයි. එය ඵල දරනු ඇත. එය සඵලවත් වෙයි.

දෙවියන්වහන්සේගේ සභාව තුළ හිඳුවන ලද අයව මේ ආකාරයට සමාන කල හැකිය. ඔවුන් දිනපතාම වර්ධනය වෙයි. ස්ථිරවූ ස්ථානයක සිටියි. ඔවුන් කරනු ලබන්නාවූ සියලුම දේ සඵලවත් වෙයි. ඔවුන් ක්‍රිස්තුස්වහන්සේගේ සභාව තුල සිටින නිසා ඔවුන් ඵල දරනු ඇත.

ස්වාමීන්වහන්සේගේ ගෘහය තුළ කැපවෙමින් ක්‍රියා කරන්නාවූ අය, ඔවුන්ගේ පාලකතුමාට උපකාර කරන අය ඵලදරන්නාවූ අය සැබවින්ම සාර්ථකත්වයට පත්වෙනු ඇත. අද බොහෝ දෙනා මෙවැනි ක්‍රියාවන් කරන්නේ නැත. සමහරු සභාවෙන් බෞතීස්මය ලැබූ

විට ඔවුන් ගැලවීම ලැබුවාය කියා සිතමින් එම සභාව අත්හැර ඔවුන්ටම සංවිධානයක් සාදාගෙන දෙවියන්වහන්සේ පිළිනොගත් ක්‍රියාවන් කරමින් විවිධාකාර ප්‍රශ්න හා කරදර වලට මුහුණ දෙමින් සිටී. ඔවුන් සාර්ථකත්වයට පත් නොවන නිසා කළකිරීමට පත්වෙති. ඔබ සාර්ථකත්වයට පත්වෙනුයේ, ඔබ විශ්වාසවන්තව ඔබගේ ක්‍රියාවන් හා වගකීම් ඉටු කරමින් ඔබට දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ තුළින් දුන්නාවූ සභාවේ වැඩපිළිවෙලත් දර්ශනයත් හරි ලෙස පිළිපදිනවා නම් ඔබට සාර්ථකත්වය ලැබෙනු ඇත.

සමහරු මෙලෙස අසනු ලබයි. මා සභාවට ගියහොත් සෑමදේම හරියයිද? ''ඔව්'' හැමදේම ඔබට හරියයි. නමුත් මේ දේ අද බොහෝ අය තේරුම් නොගනිති. මා තරුණව සිටි කාලයේදී මා මගේ පාලකතුමාගේ සපත්තු පවා පිසදමමින් ඔහුගේ සෑම වැඩකටම උපකාර කලේය. එයයි මගේ සේවය, එම කුඩා සේවයට මා විශ්වාසවන්තව සිටි නිසා දෙවියන්වහන්සේ අද මාව මෙවැනි විශාලවූ සේවයකට ගෙනවිත් තිබේ. ඔබ දෙවියන්වහන්සේගේ සභාවේ උන්වහන්සේ විසින් හිඳුවනලද පුද්ගලයෙක්ද? අද බොහෝ අය ඔවුන්ගේ පවුල් පිටින්ම ආගන්තුකයින් පමණකි. ඔවුන් ස්ථිරවම පැලවී නැත. ඒ නිසා ඵලදැරීමක් නැත. ඔබ කොපමණ දුරට ගැඹුරු ලෙස මුල් ඇද සභාව තුළින් ඔබ වර්ධනය වනවාද? එපමණ දුරට ඔබ ඵලදරන්නාවූ ආශිර්වාද ලත් සඵලවන්නාවූ පුද්ගලයෙක් වනු ඇත.

නැසීගිය පාස්ටර් ජී. සුන්දරම් ස්වාධීනව සේවය කරන්නාවූ අයට පැවසූ කාරණයක් තිබේ. එනම්, ''ඔබ කොතැනක හෝ ඔබ කැමති වෙන්නාවූ ආකාරයේ සේවයක් කිරීමට පුළුවනි. නමුත් ඔබගේ වස්ත්‍රයේ කොනක ඔබ ලණුවකින් ගැටයක් ගසා එම ලණුවෙහි අනෙක් කෙළවර යම්කිසි සභාවක ගැටගැසිය යුතුයි. ඔබගේ සභාවට වැදගත් ස්ථානයක් දිය යුතුයි. ඔබට බලය ඇත්තේ සභාව තුළින්ය. ඔබගේ සඵලත්වය තිබෙන්නේ ඔබ සභාව සමඟ වැඩකරන විටදීය. එසේ නොමැතිනම් ඔබ ආත්මික අනාථයෙක් වනු ඇත.'' මෙම කියමන සත්‍යතාවයකි.

මේ පණිවිඩය ලියන්නාවූ තැනැත්තාද නායකයකු යටතේ සිටියි. එයින් මා ආශිර්වාද ලබා තිබේ. එසේම මා යටතේද බොහෝ පාලකවරුන් සිටිති. නමුත් මට ඉහලින් සිටින පාලකවරුන්ට මා කීකරුව යටත්ව සිටිමි. ඒ ගැන මා සතුටු වෙමි. ඔබ කෙසේද?

## (4). ස්වාමීන්වහන්සේගේ දවස ප්‍රීතිමත්ය.

ඔබ සබත් දවස නොසලකා හරිනවා නම්, නුඹ මාගේ ශුද්ධ දවසේදී නුඹේම කැමැත්ත නොකරන හැටියට නුඹේ පාද සබත් දවසේදී නවත්වාගෙන සබත් දවස ප්‍රිය එකක්ය කියාද ස්වාමීන්වහන්සේගේ ශුද්ධ දවස ගෞරවනීය එකක්ය කියාද කියන්නෙහි නම්, නුඹේම මාර්ගවල නොහැසිර නුඹේම කැමැත්ත නොසොයා, හිස් වචන කථා නොකර, ඊට ගෞරව කරන්නෙහි නම්, නුඹ ස්වාමීන්වහන්සේ කෙරෙහි ප්‍රීතිමත්වන්නෙහිය, මමද පොළොවේ උසස්ථාන මතුයෙහි නැගීයන්ට නුඹට සලස්වා, නුඹේ පියවූ යාකොබ්ගේ උරුමයෙන් නුඹ පෝෂණකරන්නෙමි. මක්නිසාද ස්වාමීන්වහන්සේගේ

9 වෙනි පිටුවට ...


## SPECIAL ANNOUNCEMENT

### We Need Honorary Representatives!

Of late, we find that the number of readers of **Echo of His Call** magazine printed in Sinhala, Nepali, Urdu and Afrikaans languages has considerably reduced. This may be due to the loss of our old friends and the probable relocation of their domicile. We have been thinking of ways and means to strengthen the number of readers.

As a measure of effort, we solicit Honorary Representatives from our readers of Nepali, Urdu, Sinhala and Afrikaans to

(i) Enroll more and more readers for the magazines in their respective languages.

(ii) To come forward to print more copies and dispatch to the readers in their respective countries / areas and

(iii) Help us by raising some Honorary Representatives to provide new addresses and to promote the distribution by taking photo copies and sending them to family and friends.



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

**“...කියවන්නා තේරුම් ගනීවා....”** *(මතෙව් 24:15)*

## මගේ සේවා අංශය! MY FIELD MINISTRY!

ස්වාමීන්වහන්සේ මට ඉතා හොඳ මිත්‍රයින් ලබා දුන්නා. උන්වහන්සේගේ ශුභාරංචි සේවය කුඩා කුඩා ශුභාරංචි රැස්වීම් මාලාවන් ලෙස ක්‍රීඩාංගනවල සහ නිවෙස් වල පවත්වන පිණිස ඩී. රිචඩ් නම්බිරාජ්, විලියම් සෙල්වරාජ්, බිජිල් සැම්සන්රාජ්, ජී. චන්ද්‍රසේකර්, ඩී. වී. සෙල්වම් මහත්මිය යන අය මා සමඟ ඉතා හොඳින් සේවය කලා. මා හට උපකාර කලා.


දිනක් නාවලර් නගර් යන ස්ථානයෙහි මා එළිමහන් රැස්වීමක් තැබුවෙමි. ස්වාමීවූ යේසුස්වහන්සේගේ බලයෙන් යක්ෂයන් දුරුවිය. මිනිසුන්ගේ නොයෙකුත් බැඳුම් වලින් නිදහස් විය, ලෙඩ රෝග සුවවිය. එසේම මිනිසුන් දෙවියන්වහන්සේගේ ස්පර්ශයේ බලය ලැබිනි. දෙවියන්වහන්සේගේ ආලේපය බලවත් ලෙස ක්‍රියාත්මක විය.

එම පලාතෙහි සිටි දුප්පත්, පොහොසත්, උගත්-නූගත් යන බොහෝ අය යේසුස්වහන්සේව ඔවුන්ගේ පුද්ගලික ගැලවුම්කරු ලෙස පිළිගත්තේය. මා මගේ එකෝඩියම් සංගීත භාණ්ඩය වාදනය කරමින් ගායනා කර ළමුන් උදෙසාද වැඩසටහන් පැවැත්වුවෙමි. මිනිසුන් මා හට ගරු කිරීමට පටන්ගත්තේය. මගේ යාච්ඤා රැස්වීම් වලටද එන්න පටන්ගත්තේය. ඔවුන්ගේ ජීවිත වල තිබූ වෙනසක් සහ හාස්කම් සිදුවූ නිසා ඔවුන් සියලුදෙනාම මා යාච්ඤාව පැවැත්වූ ස්ථානයට ආවේය. වෙනත් සභාවක සාමාජිකයින්ව මා මගේ සේවයට එකතුකර ගත්තේ නැත. දෙවියන්වහන්සේ මා හට අලුත් ඇදහිලිවතුන්ම ලබා දුන්නේය. මා මේ අයව දෙවියන්වහන්සේගේ සේවයට පුහුණු කලෙමි. ඔවුන් මා සමඟ එකතු වී ශුභාරංචි පත්‍රිකා බෙදා දීමටද පටන්ගත්තේය. සැමුවෙල් ඩැනියෙල් යන අය අපට මෙම පත්‍රිකා නොමිලයේ ලබා දුන්නේය. තවද මා සමඟ සිටි අයව ගීතිකා ගායනා කිරීමට, සාක්ෂි දැරීමට, දේශනා කිරීමට හා අලුත් අයව බැහැදැකීමට පුරුදු කලෙමි. මා බොහෝ කාර්යබහුල වුවත් යාච්ඤා කිරීමට මා කාලය දුන්නෙමි. මගේ පුද්ගලික ආත්මික වර්ධනය උදෙසාත් දෙවියන්වහන්සේ මට දුන්නාවූ ආත්ම විනාශ නොවන පිණිස ගලවා ගන්නා පිණිසත් ලෝකයේ සිටින සියලුම මනුෂ්‍යයන්ගේ ගැලවීම උදෙසාත් මා නිරන්තරයෙන්ම යාච්ඤා කරමි. මනුෂ්‍යයන්ව දෙවියන්වහන්සේ වෙතට දිනාගන්නා පිණිස සෑමදෙයම දරාගැනීමට සිදුවිය. “ ***දුර්වලයන් දිනාගන්න පිණිස දුර්වලයන්ට දුර්වලයෙක් වුණෙමි. සියලු ආකාරයෙන්ම සමහරකු ගලවන පිණිස මම සියල්ලන්ට සියල්ල වුනෙමි.” (1 කොරින්ති 9:22)***



*Rev. Samuel Daniel*

1973 වසරේ එක් දිනක මවුන්ට් නැමති පාරේ E. L. S පොත්හල ඉදිරියෙහි මා සුභාරංචි පත්‍රිකා බෙදා දුන්නෙමි. එම පොත්හලේ කළමණාකරු වූයේ මාගේ මිත්‍ර



*Rev. Dr. Augustine Peters &*
*Pr. S. Sam Selva Raj*

ජේ. ආර්. ජෙයබාලන්ය. ඉතා ප්‍රසිද්ධ දේවගැති ඔගස්ටින් පීටර්ස් මට මුණගැසුනි. එම කාර්යබහුල ප්‍රධාන විදීයේ ඔහු මට අත තබා යාච්ඤා කල අතර මගේ ඔළුවට අත තබා අනාවැකියක් පැවසුවේය. එනම්, ''තරුණයා නුඹ ඉතා බලවත්වූ සේවයක් කරන පිණිස මා නුඹව සකසමි. නුඹව කැඳෙව්වේ මමයි. මම ඔබට මාගේ දීමනාවන් දෙමි. මම ඔබව උසස් කොට බොහෝ සම්පත් නුඹට දෙන්නෙමි. නුඹ විශ්වාසවන්තවූ දාසයෙක් වෙන්න'' යන ආශිර්වාද ලත් අනාවැකි පවසා ඔහු මට යාච්ඤා කලේය. දින කීපයකට පසුව මාගේ මිත්‍ර වූ රාජන් තුලින් මට කථා කොට ඔහු මාව ආලේප කලේය. ශුභාරංචිය ප්‍රකාශ කරන්නාවූ දාසයෙක් ලෙස එදා සිට දෙවියන්වහන්සේ බලය හා දර්ශනය නොඅඩුව ස්ථිර ලෙස මා හට ලබා දී තිබේ. මේ දේව දාසයා තුලින් දෙවියන්වහන්සේ මා හට පැවසූ කාරණය ඒ ආකාරයෙන්ම සිදු විය. මේ දේව දාසයා නිසා මා දෙවියන්වහන්සේට ස්තුති කරමි. ***

*7 පිටුවෙන්....*

මුඛය ඒක වදාලේය.'' ***(යෙසායා 58:13-14)***

අද සැමදෙනම දෙවියන්වහන්සේගේ දවස එනම්, ඉරුදින අපගේ සෑම වැඩකටයුතුම ටිකක් නතර කර දෙවියන්වහන්සේ තුළ ප්‍රීති වන පිණිස අප ස්වාමීන්වහන්සේගේ අභිමුඛත්වයට යා යුතුයි. අපගේ සියලුම අධර්මිෂ්ඨ වූ දේ අත්හැර දෙවියන්වහන්සේ ප්‍රිය වන්නාවූ ක්‍රියාවන් කල යුතුය. ඔබ ඔබවම සතුටුකරවන්නාවූ දේවල් නොකර එම මුළු දවසම දෙවියන්වහන්සේගේ දේ වලට පාවිච්චි කරමින් දෙවියන්වහන්සේගේ දවස තුළ ප්‍රීතිමත් වෙන්න. මේ සබත් දවස යහපත්වූ දවසකි. අප එම දවස තුළ ප්‍රීතිමත් විය යුතුය. අප එම දවස දෙවියන්වහන්සේ තුළ සැමරිය යුතුය. ඒ දවසේදී වෙන කිසිම වැඩසටහනකටවත් වෙන කිසිදු කාරණාවකටවත් ප්‍රමුඛස්ථානය නොදී දේව මෙහෙයට යාමට පළමු ස්ථානය දී සභාව තුළ ඔබ කල යුතු කාරණාවන් ඉටු කරමින් ස්වාමීන්වහන්සේ තුළ ඔබ ප්‍රීතිමත් විය යුතුය.

පළමුකොට ඔබ සභාවට ගොස් නමස්කාර කරමින් ඉන් පසුව ඔබගේ අනෙකුත් කාරණාවන් සඳහා වැඩකටයුතු සැලසුම් කරනවා නම්, ඔබට සැබෑ ප්‍රීතිය ලබාගැනීමට බැරිය. මන්ද මෙම දවස දෙවියන්වහන්සේගේ කාරණාවන් ඉටුකිරීමටත් උන්වහන්සේව සතුටු කිරීමටත් ඔබ වැඩිපුර කාලය දෙන්න.

ඔබ මේ සබත් දවස දෙවියන්වහන්සේ තුළ ප්‍රීතිමත් වෙන්නාවූ දවසක්ය කියා උන්වහන්සේගේ කාරණාවන් වලට වැඩිලෙස ඉඩ දෙනවා නම්, සැබවින්ම දෙවියන්වහන්සේ ඔබ ගැන ප්‍රිය වෙයි. මේ ලෝකයෙහි ඉහළම ස්ථානයකට ඔබව ගෙන යයි. ඔබගේ ජීවිතයේ ආර්ථික හෝ ශාරීරික අපහසුතා තිබේ නම් එසේත් නැතිනම්, ඔබගේ ජීවිතයෙහි කිසියම් අඩුවක් තිබේ නම්, ඔබ සෑම විටම දෙවියන්වහන්සේගෙන් 'ඇයි?' කියා ප්‍රශ්න කරනවා නම් ඒ සියල්ල සඳහාම ඔබට ඇති එකම පිළිතුර වන්නේ, ඔබ දෙවියන්වහන්සේගේ දවස උන්වහන්සේට දෙමින් ඒ දවසේදී දෙවියන්වහන්සේගේ කාරණාවන් ඉටු කරමින් උන්වහන්සේ තුළ ඔබ ප්‍රීති වෙනවා නම්, සැබවින්ම දෙවියන්වහන්සේ මේ පොළොවේ උසස්ථානයක ඔබව තබනවා ඇත.

## (5). මූල්‍යමය ආශිර්වාදය

මාගේ ආදායමෙන් කොටස් මා දෙවියන්වහන්සේට දුන් විට මට ඉදිරියේදී හොඳ කාලයක් තිබේද? කියා සමහරු අසයි. ඔබගේ ආදායමෙන් දසයෙන් කොටස සියල්ලම අයිති වෙන්නේ ස්වාමීන්වහන්සේටයි. ඔබ උපයන දෙයින්ද දසයෙන් කොටස අයිති වන්නේද ස්වාමීන්වහන්සේටයි. දෙවියන්වහන්සේට අයිති කොටස ඔබ දෙවියන්වහන්සේට දිය යුතුයි. ඔබගේ දසයෙන් කොටස සභාව නැමති ගබඩාගෙට ගෙනෙන්න්ය. ඔබගේ දසයෙන් කොටස සංගරා සේවයටවත්, වෙනත් සේවා වලටවත් හෝ කඩින් කඩ හෝ නොදිය යුතුයි. මෙය නොයෙකුත් සුභාරංචි රැස්වීම් හෝ සම්මේලන සඳහා වියදම් කිරීම නොකල යුතු අතර දසයෙන් කොටස ඔබ සාමාජිකත්වය දරන්නාවූ සභාවට දිය යුතුය. එය සම්පූර්ණයෙන්ම ඔබගේ සභාවට අයිති දෙයකි. සභාව එම මුදල දෙවියන්වහන්සේගේ සේවය උදෙසා පාවිච්චි කල හැකිය.

ඉතාම වැදගත්වූ කාරණය නම්, ඔබ ඔබට කියා හොඳ සභාවක් තෝරගත යුතුයි. එම සභාව ඔබගෙන් ලැබෙන්නාවූ මුදල් සභාවේ සේවයට හා එහි නඩත්තු කටයුතු උදෙසා පාවිච්චි කල යුතුය. දේව වචනය පවසන්නේ ඔබගේ දසයෙන් කොටස ගබඩාගෙට ගෙනෙන්න කියාය. ගබඩා ගෙය නම් දෙවියන්වහන්සේගේ සභාවයි. මෙම දසයෙන් කොටස ඔබ වෙනුවෙන් පාවිච්චි කිරීමට ඔබට අයිතියක් නැත. ඔබ මෙම මුදලට අත නොගසා එය දේව සේවය උදෙසා සභාවට දිය යුතුය.

ඔබගේ දසයෙන් කොටස සභාව නැමති ගබඩාගෙට ගෙනෙන්න්ය. ඔබ මෙම දසයෙන් කොට ස්වාමීන්වහන්සේට දී උන්වහන්සේව සෝදිසි කර

RNI NO. TN/SIH/2006/17846

බලන්නය කියා දේව වචනය පවසයි. එසේම 'ස්වර්ගයේ කවුළු ඇර ඔබට මා ආශිර්වාද කරන්නේ නැද්ද? කියා බලන්නය' කියා උන්වහන්සේ පවසයි. දෙවියන්වහන්සේගේ වදන සත්‍යයි. එම වචනයට විරුද්ධව අපට කිසි දෙයක් අඩු කිරීමටවත් වැඩ කිරීමටවත් නොහැකිය. මගේ ජීවිතයේ මට ලැබුණු ආදායමෙන් දසයෙන් කොටස දීම කරණකොට ගෙන මා සෑම අතින්ම ආශිර්වාදය ලැබුවාවූ කෙනෙකි. සමහරවිට අපට කුඩා ආදායමක් ලැබුණු විට අප එම ආදායමෙන් දසයෙන් කොටස දෙයි. නමුත් අපට විශාල ආදායමක් ලැබුණු විට එයින් දසයෙන් කොටස දීම අපට ඉතාම අමාරුය. රුපියල් 100 ක ආදායමක් ඔබට ලැබුණු විටදී එයින් රුපියල් 10 ක දසයෙන් කොටසක් දීම පහසුය. රුපියල් 1000 ක් ලැබුණු විටදී රුපියල් 100 ක් දීමත් සාමාන්‍ය දෙයකි. නමුත් රුපියල් 10 000 ක මුදල් ලැබුණු විටදී රුපියල් 1000 ක් දීම එතරම් පහසු කාරණයක් වන්නේ නැත. දෙවියන්වහන්සේ අපට ආශිර්වාද කරන්න ආශිර්වාද කරන්න අපගේ ආශිර්වාදය වැඩිවෙන්න වැඩි වෙන්න අප දෙවියන්වහන්සේගේ කොටස ඉතා විශ්වාසවන්තව දිය යුතුය. එවිට ස්වාමීන්වහන්සේ ඔබට ස්වර්ග රාජ්‍යයේ කවුළු විවර කරයි. මෙය මහත්වූ අභිරහසකි. බොහෝ අය මෙම සත්‍යතාවය දන්නේ නැත. ඔබ මේ දේ කර සිදුවන්නේ කුමක්ද කියා බලන්න. ජයග්‍රහණය ඔබ වෙත පැමිණෙයි...

************

## කැඳවීමේ ප්‍රතිරාවය

සෑම මසකම භාෂා 16 කින් නිකුත් වන සඟරාව, බයිබල් විද්‍යාලය, තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව, සභා රෝපණය, පාසැල් අධ්‍යාපනික සේවය, සුභාරංචි රැස්වීම් මාලා, සම්මේලනය පැවැත්වීම ආදිය.

| | |
|---|---|
| වාර්ෂික දායකත්වය - රු. 100/- | ජීවිත දායකත්වය - රු. 2000/- |

කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ විවිධාකාර සේවාවන් අප පවත්වාගෙන යනු ලබන්නේ ඔබගේ උපකාරයන් හා ස්වේච්ඡාවෙන් ඔබ දෙන සම්මාදන් හා දීමනා කරණකොටගෙනය. ස්වාමීන්වහන්සේ ඔබට මඟපෙන්වන්නාවූ ආකාරයෙන් කැඳවීමේ ප්‍රතිරාවය සේවයට උපකාර කිරීමට ඔබටද හැකිය. ඔබ දෙන්නාවූ උපකාර කරණකොට ගෙන දෙවියන්වහන්සේව නොදන්නාවූ සෙනඟට සුභාරංචිය ප්‍රකාශ කිරීමට උපකාර වෙනවා ඇත.

ඔබට මෙම සඟරාව අවශ්‍ය නම්, කරුණාකර අපට දන්වා එවන්න. ඔබගේ ඊ-මේල් ලිපිනය හා දුරකථන අංකයද, එසේම ඔබගේ ලිපිනය වෙනස් කරනවා නම් එම වෙනස් වූ ලිපිනයද අපට දන්වා එවන්න.

අපගේ වෙබ් අඩවියට ගොස් මෙම භාෂා 16 කින් ඇති සඟරාවන් බලා ගැනීමට ඔබට හැකිවනු ඇත. ඔබගේ ලිපි, යාච්ඤා ඉල්ලීම් සහ ඔබගේ උපකාරයන් පහත ලිපිනයට අප වෙත එවන්න.

කරුණාකර ඔබගේ දුරකථන අංකය, ජංගම දුරකථන අංකය හා ලිපිනය අප වෙත එවන්න.

**ECHO OF HIS CALL**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98412 71858, 98410 71852
E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**
on 2nd **FEBRUARY 2023.**
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

**To**

***GOD BLESS YOU!***

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**